## අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

## ආර්ථික විද්‍යාව I

පැය දෙකයි

සැලකිය යුතුයි :

★ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

★ **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.

**01.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් සූක්ෂම ආර්ථික න්‍යාය ට අදාළ වන ප්‍රකාශය කුමක්ද?

(1) යෙදවුම් මිල ඉහළයාම මිල මට්ටම ඉහළයාමට හේතුවේ.
(2) සමස්ත නිෂ්පාදිතය පහළයාම සේවා නියුක්තිය පහළයාමට හේතුවේ.
(3) පොළී අනුපාතිකය පහළයාම මුදල් ඉල්ලුම ඉහළයාමට හේතුවේ.
(4) මුදල් සැපයුම ඉහළයාම පොළී අනුපාතිකය පහළයාමට හේතුවේ.
(5) ආන්තික ඵලදාව පහළ යාම, ආන්තික පිරිවැය ඉහළ යාමට හේතු වේ.

**02.** කිසියම් ආර්ථිකයකට අදාළ නිෂ්පාදන හැකියා මායිම් රූප සටහනක් පහත දැක්වේ.




ඉහත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට අදාළ, වඩාත් නිවැරදි ප්‍රකාශය පහත පිළිතුරු අතුරින් තෝරන්න.

(1) සමජාතීය සම්පත් නිෂ්පාදනයට යොදා ගෙන ඇත.
(2) සමාන ශිල්පීය ක්‍රමයක් නිෂ්පාදනයට යොදා ගෙන ඇත.
(3) සමජාතීය නොවන සම්පත් නිෂ්පාදනයට යොදා ගෙන ඇත.
(4) සම්පත්වල ඵලදායීතාවයේ වෙනසක් සිදු වී ඇත.
(5) එක් කර්මාන්තයකට යෙද වූ සම්පත් අනෙක් කර්මාන්තයට ද ඒ ආකාරයෙන් ම යොදා ගත හැක.

**03.** මධ්‍යගත සැලසුම් ආර්ථිකයක මිල මගින් ඉටු කෙරෙන කාර්යයක් වනුයේ,

(1) නිපදවිය යුතු භාණ්ඩ කවරේද යන්න පිළිබඳව මධ්‍යගත සැලසුම් මණ්ඩලයට මග පෙන්වීමයි.
(2) නිෂ්පාදකයින්ට ලාභ උපයා දීම මගින් සානුබල සැපයීමයි.
(3) හිඟ සම්පත් විකල්ප අරමුණු අතර සලාක කිරීමයි.
(4) ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මෙවලමක් වීමයි.
(5) කුටුම්බ අතර සාධක ආදායම් ව්‍යාප්තිය තීරණය කිරීමයි.

**04.** "වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය තුළ පාරිභෝගික ස්වාධිපත්‍යයක් ඇත." යන්න පහත සඳහන් කවර කරුණ මගින් පැහැදිළි කළ හැකිද?

(1) පාරිභෝගිකයින් ඉල්ලුම් කරන භාණ්ඩ වෙළෙඳපොළ මගින් සැපයීම.
(2) පාරිභෝගිකයින්ට අත්‍යාවශ්‍ය භාණ්ඩ පමණක් සැපයීමට රජය මග පෙන්වීම.
(3) තම කැමැත්ත පරිදි ශ්‍රමය සංචලනය කිරීමට ශ්‍රමිකයාට නිදහස තිබීම.
(4) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා රජය මිල පාලනයේ යෙදීම.
(5) ස්වභාවික ඒකාධිකාරී තත්වයක් වෙළෙඳපොළේ පැවතීම.

[2වන පිටුව බලන්න.

**05.** නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත සෑම ලක්ෂ්‍යයකදීම අපේක්ෂා කළ හැකි තත්ත්වයක් වන්නේ,

(1) සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවයයි
(2) ආර්ථික කාර්යක්ෂමතාවයි
(3) නිෂ්පාදන කාර්යක්ෂමතාවයයි
(4) මිල ස්ථායිතාවයයි
(5) නිෂ්පාදිතය බෙදීයාමේ සාධාරණත්වයයි

**06.** සලකා බලන භාණ්ඩයක මිල වැඩි වීමකදී එහි ඉල්ලුම් ප්‍රමාණය අඩු වීමට බලපාන ආදායම් ප්‍රතිවිපාකය වන්නේ,

(1) සාපේක්ෂ මිල අඩු භාණ්ඩ වෙතට පාරිභෝගිකයින් මාරු වීමයි.
(2) භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූර්ත ආදායම ඉහළ යාමයි.
(3) භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූර්ත ආදායම පහළ යාමයි.
(4) සලකා බලන භාණ්ඩයේ මිල, අනාගතයේදී අඩුවෙතැයි අපේක්ෂාවෙන් එහි ඉල්ලුම අඩුකිරීමයි.
(5) භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූල්‍ය ආදායම අඩුවී ඉල්ලුම අඩුවීමයි.

**07.** භාණ්ඩ දෙවර්ගයක මිල වෙනස්වීම හා ව්‍යාපාර අයභාරය වෙනස්වීම පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩය | මිල වැඩි වීම | ව්‍යාපාරික අයභාරය වෙනස් වීම |
|---|---|---|
| A | 10% | 5% |
| B | 20% | -10% |

ඉහත තොරතුරු උපයෝගී කර ගනිමින් A හා B භාණ්ඩවල මිල ඉල්ලුම් නම්‍යතාව නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

| | A භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව | B භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|
| (1) | අනම්‍ය වේ. | ඒකීය නම්‍ය වේ. |
| (2) | ඒකීය නම්‍ය වේ. | නම්‍ය වේ. |
| (3) | අනම්‍ය වේ. | නම්‍ය වේ. |
| (4) | පූර්ණ නම්‍ය වේ. | පූර්ණ අනම්‍ය වේ. |
| (5) | නම්‍ය වේ. | අනම්‍ය වේ. |

**08.** කිසියම් භාණ්ඩයක සැපයුම් ශ්‍රිතය $Q_S = -30 + 5P$ වේ. මෙහි සැපයුම් නම්‍යතාවයේ හැසිරීම පිළිබඳව කියවෙන නිවැරදි ප්‍රකාශය පහත පිළිතුරු ඇසුරෙන් තෝරන්න.

| | **සැපයුම් නම්‍යතාවය** | **මිල වැඩිවන විට නම්‍යතා සංගුණකය වෙනස් වන ආකාරය** |
|---|---|---|
| (1) | එකට වඩා අඩුවේ | ඉහළ යයි |
| (2) | එකට වඩා අඩුවේ | පහළ යයි |
| (3) | එකට වඩා වැඩිවේ | පහළ යයි |
| (4) | එකට වඩා වැඩිවේ | ඉහළ යයි |
| (5) | ඒකීය නම්‍ය වේ | වෙනස් නොවේ |

**09.**




ඉහත රූප සටහන අනුව S සහ $S_1$ සැපයුම් වක්‍රවල A ලක්ෂ්‍යයට අදාළ මිල සැපයුම් නම්‍යතාවන් වන්නේ පිළිවෙළින්

(1) 0.8 හා 1.2 වේ
(2) 0.8 හා 1.5 වේ
(3) 1.0 හා 0.8 වේ
(4) 1.25 හා 0.5 වේ
(5) 1.25 හා 0.8 වේ

10. $Q_d = 30 - 2P$
$Q_s = 14 + 2P$
ඉහත දැක්වෙන ඉල්ලුම් හා සැපයුම් සමීකරණ උපයෝගී කරගෙන පාරිභෝගික අතිරික්තය ගණනය කළ විට ලැබෙන වටිනාකම වන්නේ,
(1) රු. 18 යි (2) රු. 22 යි (3) රු. 44 යි (4) රු. 121 යි (5) රු. 242 යි

11. පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක අධි ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණයකි.
$Q_{ed} = 28 - 7P$
$Q_s = -8 + 6P$
මෙහි සමතුලිත මිල හා ප්‍රමාණය වන්නේ පිළිවෙලින්
(1) රු. 4 යි. ඒකක 16 යි.
(2) රු. 4 යි. ඒකක 56 යි.
(3) රු. 7 යි. ඒකක 20 යි.
(4) රු. 16 යි. ඒකක 34 යි.
(5) රු. 28 යි. ඒකක 56 යි.

12. පහත රූප සටහනේ දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයකට ඒකක බදු පැනවීමේ අවස්ථාවකි.




රූප සටහන අනුව බදු පැනවීමෙන් පසු පහත දැක්වෙන කවර තත්ත්වය නිවැරදි වේද?

| | බද්දට පසු ආර්ථික අතිරික්තය | රජයේ බදු ආදායම | අහිමිවන සමාජ ශුභ සාධනය |
|---|---|---|---|
| (1) | A + G | B + C + E | D |
| (2) | A + D | B + C | D + F |
| (3) | D + F | B + C + E | D + F |
| (4) | A + G | B + C + E | D + F |
| (5) | G + F | B + C | F |

13. එක්තරා භාණ්ඩයකට රජය විසින් ඒකක සහනාධාර ලබාදීමෙන් අනතුරුව වෙළඳ පොළ තත්ත්වය පහත දැක්වේ.

රූප සටහනට අනුව සහනාධාරය සඳහා රජය දරන වියදම හා අහිමිවන සමාජ ශුභ සාධනය පිළිබඳ පහත දැක්වෙන අගයන් අතුරින් නිවැරදි අගයන් දැක්වෙන පිළිතුර කුමක්ද?

| | සහනාධාරය සඳහා රජයේ වියදම | අහිමිවන සමාජ ශුභ සාධනය |
|---|---|---|
| (1) | රු 4000 | රු 1000 |
| (2) | රු 8000 | රු 500 |
| (3) | රු 4000 | රු 500 |
| (4) | රු 6000 | රු 1000 |
| (5) | රු 8000 | රු 1000 |




[4වන පිටුව බලන්න.

14. පහත රූප සටහනේ දැක්වෙන්නේ ආණ්ඩුව විසින් කිසියම් භාණ්ඩයකට උපරිම මිල නියම කළ අවස්ථාවකි.




$P_1$ මිල ඵලදායි ලෙස ක්‍රියාත්මක කර ගැනීමට හැකියාව ලැබුනහොත් b හා d වටිනාකම,

(1) නිෂ්පාදක අතිරික්තයේ කොටසක් වේ.
(2) නිෂ්පාදක ලාභයට එකතු වේ.
(3) පාරිභෝගික අතිරික්තයේ කොටසක් වේ.
(4) රජයේ ආදායමට එකතු වේ.
(5) නිෂ්පාදකයාට අහිමි වී යන කොටසක් වේ.

15. පහත දැක්වෙන්නේ කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක විචල්‍ය යෙදවුම් වැඩිකරන විට, ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව වෙනස් වන ආකාරයයි.




ඉහත රූප සටහනේ $L_1$ සිට $L_2$ දක්වා විචල්‍ය යෙදවුම් වැඩි කරත්ම කෙටි කාලීන සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා ආන්තික පිරිවැය වෙනස් වන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | සාමාන්‍ය විචල්‍ය පිරිවැය | ආන්තික පිරිවැය |
|---|---|---|
| (1) | පහළ යයි | පහළ යයි |
| (2) | පහළ යයි | ඉහළ යයි |
| (3) | ඉහළ යයි | ඉහළ යයි |
| (4) | ඉහළ යයි | පහළ යයි |
| (5) | ඉහළ යයි | ස්ථාවරව පවතී |

16. මෙම රූප සටහනේ දැක්වෙන ආයතනය සම්බන්ධයෙන් ඔබට එකඟ විය හැකි ප්‍රකාශය තෝරන්න.




(1) ආයතනයේ ලාභ උපරිම වන්නේ $E_1$ ලක්ෂ්‍යයට අදාළ නිමැවුම් මට්ටමේදී ය.
(2) E ලක්ෂ්‍යයට අදාළ නිමැවුම් මට්ටමේ දී ආයතනය ආර්ථික ලාභයක් උපයනු ලබයි.
(3) E ලක්ෂ්‍යයට අදාළ නිමැවුම් මට්ටමේ දී ආයතනය අලාභයක් උපයනු ලබයි.
(4) ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය, E ලක්ෂ්‍යයේ සිට ඉහළට බෑවුම්වන ආන්තික පිරිවැය වක්‍රය වේ.
(5) ආයතනයේ අවම සැපයුම් මිල P වේ.

17. පූර්ණ තරග ආයතනයක පිරිවැය හා අයභාර තත්වයන් පහත රූප සටහන මගින් දැක්වේ.




ඉහත ආයතනය භාණ්ඩය අලෙවි කරන මිල රු. 40 නම් කෙටි කාලීන ලාභ උපරිම නිමැවුම් මට්ටම, ආර්ථික ලාභය, මුළු ස්ථාවර පිරිවැය හා මුළු විචල්‍ය පිරිවැය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | ලාභ උපරිම නිමැවුම | ආර්ථික ලාභය | මුළු ස්ථාවර පිරිවැය | මුළු විචල්‍ය පිරිවැය |
|---|---|---|---|---|
| (1) | 15 | 75 | 150 | 500 |
| (2) | 15 | 75 | 150 | 550 |
| (3) | 20 | 100 | 150 | 550 |
| (4) | 20 | 100 | 200 | 450 |
| (5) | 20 | 100 | 200 | 700 |

18. ආර්ථිකයක සම්පත් උපයෝජනය තුළ ඇතුළත් කරන සංරචක වනුයේ,
(1) දළ දේශීය වියදම සහ භාණ්ඩ හා සේවා ආනයනවල වටිනාකමයි.
(2) දළ දේශීය නිෂ්පාදිතය සහ භාණ්ඩ හා සේවා අපනයනවල වටිනාකමයි.
(3) පරිභෝජන වියදම් සහ භාණ්ඩ හා සේවා අපනයනවල වටිනාකමයි.
(4) දළ දේශීය නිෂ්පාදනය සහ භාණ්ඩ හා සේවා ආනයනවල වටිනාකමයි.
(5) දළ දේශීය වියදම සහ භාණ්ඩ හා සේවා අපනයනවල වටිනාකමයි.

19. කිසියම් ආර්ථිකයක රබර් කිරි නිෂ්පාදිතයේ වටිනාකම රු. මි. 10,000 කි. රබර් ෂීට් නිෂ්පාදිතයේ අලුතින් එකතු වූ වටිනාකම රු.මි.18,000කි. මෙම යෙදවුම් මගින් රබර් සෙරෙප්පු නිෂ්පාදනය කළහොත් එම සියලු නිෂ්පාදිතයන්හි මුළු වටිනාකම්වල එකතුව රු. මි. 72,000 කි. සෙරෙප්පු නිෂ්පාදන ක්‍රියාවලියේ එකතු කළ වටිනාකම්වල එකතුව වන්නේ,
(1) රු. මි. 56,000 කි.
(2) රු. මි. 44,000 කි.
(3) රු. මි. 26,000 කි.
(4) රු. මි. 18,000 කි.
(5) රු. මි. 10,000 කි.

20. පහත දැක්වෙන්නේ ගෙවුම් ශේෂ ලේඛනය තුළ ඇතුළත් දත්ත කිහිපයකි.

| | |
|---|---|
| වෙළෙඳ ශේෂය ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ | – 9409 |
| සේවා ගිණුමේ ශේෂය | 1250 |
| ආදායම් ගිණුමේ ශේෂය | – 1148 |

ජාතික ගිණුම්වලට ඉහත අගයන් මගින් ඇති කරන බලපෑම නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ ජාතික නිෂ්පාදිතය වැඩි වී ඇත.
(2) දළ දේශීය වියදමට වඩා දළ දේශීය නිෂ්පාදිතය වැඩි වී ඇත.
(3) දළ දේශීය වියදමට වඩා දළ ජාතික නිෂ්පාදිතය මත කළ වියදම වැඩි වී ඇත.
(4) දළ දේශීය නිෂ්පාදිතය, දළ දේශීය වියදමට වඩා අඩු වී ඇත.
(5) දළ දේශීය නිෂ්පාදිතය, දළ දේශීය වියදමට සමාන වී ඇත.

[6වන පිටුව බලන්න.

21. සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 100 + 0.8Yd$ වේ. ස්වාධීන බදු 100 ක් හා රජයේ සංක්‍රාම වියදම 80 ක් රජය විසින් ක්‍රියාත්මක කළහොත් එම බලපෑම ගැළපුම් කළ පසු පරිභෝජන ශ්‍රිතය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) $C = 84 + 0.8Y$
(2) $C = 84 + 0.8Yd$
(3) $C = 104 + 0.8Y$
(4) $C = 116 + 0.8Y$
(5) $C = 120 + 0.8Y$

22. සංවෘත ආර්ථිකයක සමස්ත කාන්දුවීම් ශ්‍රිතය වෙනස් වූ ආකාරය පහත රූප සටහනේ දැක්වේ.




කාන්දුවීම් ශ්‍රිතය වෙනස් වූ පසුව, ආර්ථිකයේ ස්වාධීන වියදම් ගුණකය හා සමතුලිත ජාතික ආදායමට ඇතිවන බලපෑම් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | ස්වාධීන වියදම් ගුණකය | සමතුලිත ජාතික ආදායම |
|---|---|---|
| (1) | ඉහළ යයි. | පහළ යයි. |
| (2) | පහළ යයි. | ඉහළ යයි. |
| (3) | ඉහළ යයි. | ඉහළ යයි. |
| (4) | ඉහළ යයි. | වෙනස් නොවේ |
| (5) | පහළ යයි. | පහළ යයි. |

23. සරල ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව ස්ථාවරව තිබියදී සමාහාර වියදම් ශ්‍රිතය ඉහළට විතැන් වූ ආකාරය පහත රූප සටහනේ දැක්වේ. මෙම ආර්ථිකයේ ගුණකය හා $E_1$ සමාහාර වියදම් ශ්‍රිතය අනුව නව සමතුලිත ආදායම නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | ගුණකය | නව සමතුලිත ආදායම |
|---|---|---|
| (1) | 4 | 1300 |
| (2) | 5 | 1600 |
| (3) | 4 | 1600 |
| (4) | 5 | 1700 |
| (5) | 4 | 1500 |




24. ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම පවත්වා ගැනීමට අවශ්‍ය සමාහාර ඉල්ලුම $E = 1000 + 0.8Y$ වේ. මෙම ආර්ථිකයේ සැබෑ සමාහාර ඉල්ලුම $E = 1200 + 0.8Y$ දක්වා වැඩි වුවහොත් ඇතිවන ප්‍රතිවිපාක වනුයේ,
(1) මූර්ත නිමැවුම ඉහළ ගොස් සේවා වියුක්ති පරතරයක් ඇති වීම.
(2) මූර්ත නිමැවුම පහළ ගොස් සේවා වියුක්ති පරතරයක් ඇති වීම.
(3) මූර්ත නිමැවුම ඉහළ ගොස් උද්ධමන පරතරයක් ඇති වීම.
(4) මූර්ත නිමැවුම ස්ථාවරව තිබියදී උද්ධමන පරතරයක් ඇති වීම.
(5) මූර්ත නිමැවුම ස්ථාවරව තිබියදී අවධමන පරතරයක් ඇති වීම.

[7වන පිටුව බලන්න.

**25.** කිසියම් ආර්ථිකයක පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය රු.බි. 1500 ක් වන අතර සංසරණ ප්‍රවේගය 75 කි. මිල මට්ටම 25 ක් වන්නේ නම් මුදල් සැපයුම හා මූර්ත නිෂ්පාදිතය පිළිවෙළින්

(1) 3 හා 60 කි (2) 10 හා 30 කි (3) 20 හා 60 කි (4) 30 හා 375 කි (5) 60 හා 375 කි

**26.** ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනයකට හේතුවිය හැක්කේ,

(1) මුදල් සැපයුම පහළ යාම ය.
(2) රාජ්‍ය වියදම ඉහළ යාම ය.
(3) පොළී අනුපාතිකය ඉහළ යාම ය.
(4) ආදායම් බදු ඉහළ දැමීම ය.
(5) ආනයනිත යෙදවුම්වල මිල ඉහළ යාම ය.

**27.** බාටර් ක්‍රමය හෙවත් සෘජු හුවමාරු ක්‍රමය බිඳ වැටීමට බලපෑ ප්‍රබලතම හේතුව වූයේ

(1) ප්‍රවාහන දුෂ්කරතාවයි.
(2) රැස්කර තබා ගැනීමේ දුෂ්කරතාවයි.
(3) කුඩා කොටස්වලට බෙදීමේ අපහසුතාවයි.
(4) නීත්‍යානුකූල වලංගු බවක් නොතිබීමයි.
(5) දෙපාර්ශවයේ වුවමනා සම්පාත කර ගැනීමේ අපහසුතාවයි.

**28.** සමපේක්ෂණ මුදල් ඉල්ලුම සඳහා පදනම් වන මුදලේ කාර්යය කුමක්ද?

(1) විනිමය මාධ්‍යයක් වීම
(2) වටිනාකමේ සන්නිධියක් වීම
(3) වටිනාකමේ මිනුමක් වීම
(4) විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම
(5) ගිණුම් ඒකකයක් වීම

**29.** පහත සඳහන් සංරචක අතරින් $M_2b$ මූල්‍ය සමස්තයේ සංරචකයක් **නොවන්නේ** කුමක්ද?

(1) මහජනයා සතු ව්‍යවහාර මුදල්
(2) මහජනයා සතු ඉල්ලුම් තැන්පතු
(3) මහජනයා නමින් වාණිජ බැංකුවල පවතින ඉතුරුම් හා කාලීන තැන්පතු
(4) විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල නේවාසිකයින් සතු තැන්පතු
(5) බලපත්‍රලාභී විශේෂ බැංකුවල ඇති පෞද්ගලික තැන්පතු

**30.** එක්තරා ආර්ථිකයක මූල්‍ය තොරතුරු කිහිපයක් පහත දැක්වේ. සියලු ම සංඛ්‍යා රුපියල් දශ ලක්ෂවලිනි.

| | |
|---|---|
| මහජනයා සතු ව්‍යවහාර මුදල් | 600 |
| වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් | 200 |
| මහජනයා නමින් ඇති මුළු තැන්පතු | 1000 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය | 10% |
| මහජනයා නමින් වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු | 400 |

ඉහත තොරතුරු අනුව ආර්ථිකයේ **මුදල් පදනම** හා පටු **මුදල් සැපයුම මත මුදල් ගුණකය** නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | **මුදල් පදනම** | **මුදල් ගුණකය** |
|---|---|---|
| (1) | 800 | 1 |
| (2) | 900 | 1.33 |
| (3) | 900 | 1.77 |
| (4) | 1200 | 1.16 |
| (5) | 1800 | 1.33 |

**31.** වාණිජ බැංකු ශේෂ පත්‍රයක වත්කම් කිහිපයක් පහත දැක්වේ

A - අතැති මුදල්
B - භාණ්ඩාගාර බැඳුම්කර
C - මහ බැංකුවේ තැන්පත් කළ මුදල්
D - භාණ්ඩාගාර බිල්පත්
E - අතැති හා විදේශ බැංකුවලින් අයවිය යුතු විදේශ මුදල්

ද්‍රවශීලීතාව අවරෝහන පිළිවෙළට ඉහත සඳහන් වත්කම් නිවැරදිව පෙළගස්වා ඇති පිළිතුර කුමක්ද?

(1) A B C D E
(2) A C E D B
(3) A E B C D
(4) A E C B D
(5) B A C D E

**32.** එක්තරා පුද්ගලයෙක් රු. 2400ක මුදලක් වාණිජ බැංකුවක තැන්පත් කරන ලදී. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය 20%ක් නම්, මෙම තැන්පතුව පදනම් කරගෙන බැංකු පද්ධතියට මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය වනුයේ,

(1) රු. 24 000 කි.
(2) රු. 14 400 කි.
(3) රු. 12 000 කි.
(4) රු. 9 600 කි.
(5) රු. 2 400 කි.

**33.** පහත සඳහන් භාණ්ඩ වර්ග අතුරින් පොදු භාණ්ඩ හා අර්ධ පොදු භාණ්ඩ නිවැරදි ව පෙළගැස්වූ පිළිතුර කුමක්ද?

A වායු ගෝලය B උද්‍යාන C ජාතික ආරක්ෂාව D පරිසර සංරක්ෂණය
E මුහුදු වෙරළ F මහා මාර්ග

| | පොදු භාණ්ඩ | | අර්ධ පොදු භාණ්ඩ |
|---|---|---|---|
| (1) | A, B, C | හා | D, E, F |
| (2) | A, B, E | හා | C, D, F |
| (3) | A, C, D | හා | B, E, F |
| (4) | A, D, E | හා | B, C, F |
| (5) | A, D, F | හා | B, C, E |

**34.** වෙළෙඳ පොළ ක්‍රියාකාරීත්වයට බාහිරතා ගැළපුම් කළ පසු ප්‍රශස්ත නිමැවුම් මට්ටම පහත දැක්වේ.




ඉහත රූප සටහනේ ($Q_2$ - $Q_1$) මගින් සහ (A - B) මගින් දැක්වෙන දෑ නිවැරදිව සඳහන් වන පිළිතුර කුමක් ද?

| | ($Q_2$ - $Q_1$) | (A - B) |
|---|---|---|
| (1) | වෙළෙඳ පොළේ ඌන පරිභෝජනය | බාහිර ප්‍රතිලාභය |
| (2) | වෙළෙඳ පොළේ අධි පරිභෝජනය | බාහිර ප්‍රතිලාභය |
| (3) | වෙළෙඳ පොළේ අධි නිෂ්පාදිතය | බාහිර පිරිවැය |
| (4) | වෙළෙඳ පොළේ ඌන පරිභෝජනය | බාහිර පිරිවැය |
| (5) | වෙළෙඳ පොළේ අධි පරිභෝජනය | බාහිර පිරිවැය |

**35.** කිසියම් වර්ෂයක දී රාජ්‍ය බදු ආදායම වෙනස්වීමේ වාර්ෂික ප්‍රතිශතය 48%ක් විය. වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වීමේ වාර්ෂික ප්‍රතිශතය 60%ක් වේ නම් මෙම ආර්ථිකයෙහි රාජ්‍ය බදු ආදායම් සංවේදිතා සංගුණකය කොපමණ ද?

(1) 0.08 කි. (2) 0.8 කි. (3) 1.25 කි. (4) 1.5 කි. (5) 8 කි.

**36.** ප්‍රතිචක්‍රීය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයින් ක්‍රියා කළ යුතු ආකාරය දැක්වෙන වඩාත්ම නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ආර්ථික පසුබැසීමක් පවතින විට රාජ්‍ය වියදම් අඩු කොට බදු වැඩි කළ යුතු ය.
(2) ආර්ථික පසුබැසීමක් පවතින විට රාජ්‍ය වියදම් හා බදු වැඩි කළ යුතු ය.
(3) ආර්ථික ප්‍රසාරණයක් පවතින විට රාජ්‍ය වියදම් හා බදු අඩු කළ යුතු ය.
(4) ආර්ථික ප්‍රසාරණයක් පවතින විට රාජ්‍ය වියදම් වැඩි කොට බදු අඩු කළ යුතු ය.
(5) ආර්ථික පසුබැසීමක් පවතින විට රාජ්‍ය වියදම් වැඩි කොට බදු අඩු කළ යුතු ය.

37. මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට භාවිත කළ මූලාශ්‍රය වී ඇත්තේ,
(1) භාණ්ඩාගාර බිල්පත්‍ය. (2) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරය.
(3) රුපියල් සුරැකුම්පත්‍ය. (4) භාණ්ඩාගාර බැඳුම්කරය.
(5) මහ බැංකු අත්තිකාරම්ය.

38. රටවල් දෙකක එක් ශ්‍රමිකයකුගේ ඵලදාව පහත දක්වා ඇත.

| භාණ්ඩය | x රට | y රට |
|---|---|---|
| ඇඟළුම් | 10 | 03 |
| තිරිඟු | 20 | 12 |

ඉහත තොරතුරු අනුව රටවල් දෙකටම වාසි ලැබිය හැකි හුවමාරු අනුපාතයක් වන්නේ,
(1) ඇඟළුම් 1 = තිරිඟු 3 (2) තිරිඟු 1 = ඇඟළුම් 1.5
(3) තිරිඟු 1 = ඇඟළුම් 2 (4) ඇඟළුම් 1 = තිරිඟු 1.5
(5) තිරිඟු 1 = ඇඟළුම් 3

39. ශ්‍රී ලංකා වෙළඳපොළේ අලෙවි වන ආනයනික පාවහන් යුගලයක මිල රු. 500/- කි. නමුත් රු. 300/- ක ආනයනික යෙදවුම් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ ද මෙම පාවහන් නිෂ්පාදනය කරයි. මේ නිසා රජය ආනයනික පාවහන් මත 25% ක තීරු බද්දක් අය කරනු ලැබුවේ නම්, සඵල අරක්ෂණ අනුපාතය වන්නේ,
(1) 16% කි (2) 40% කි (3) 50% කි (4) 62.5% කි (5) 67.5% කි

40. රටක 'ආනයන ශක්‍යතාවය' රඳා පැවතිය හැකි වඩාත් ම වැදගත් සාධක යුගලය කුමක්ද?
(1) අපනයන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, විනිමය අනුපාතය
(2) අපනයන වටිනාකම, රාජ්‍ය ප්‍රතිපත්ති
(3) භාණ්ඩ හා සේවා ආනයන ප්‍රමාණය, ආනයන භාණ්ඩවල මිල
(4) වෙළෙඳ ශේෂය, විනිමය අනුපාතය
(5) විදේශ විනිමය ඉපැයුම්, ආනයන භාණ්ඩ හා සේවා වල මිල

41. විදේශ රටවලින් ලබා දෙන සේවක වන්දි ගෙවීම් ගෙවුම් ශේෂයේ සටහන් වන්නේ,
(1) භාණ්ඩ හා සේවා ගිණුමෙහිය.
(2) ආදායම් ගිණුමෙහිය.
(3) වෙළෙඳ ගිණුමෙහිය.
(4) වර්තන සංක්‍රාම ගිණුමෙහිය.
(5) ප්‍රාග්ධන සංක්‍රාම ගිණුමෙහිය.

42. විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමක්, වෙළෙඳ ශේෂය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කළ හැකි වන්නේ ආනයන හා අපනයන නම්‍යතාව පිළිවෙළින්,
(1) 0.5 හා 0.4 වූ විටදීය.
(2) 0.6 හා 0.2 වූ විටදීය.
(3) 0.2 හා 0.4 වූ විටදීය.
(4) 0.7 හා 0.5 වූ විටදීය.
(5) 0.3 හා 0.3 වූ විටදීය.

43. පහත සඳහන් කවර අංගයක අඛණ්ඩ වර්ධනයක් ආර්ථික වෘද්ධිය ලෙස සැලකේ ද?
(1) දළ දේශීය නිෂ්පාදිතය (2) දළ ජාතික නිෂ්පාදිතය
(3) මූර්ත ජාතික නිෂ්පාදිතය (4) ජනගහන වර්ධනයට සාපේක්ෂව මූර්ත ජාතික නිෂ්පාදිතය
(5) විභව නිෂ්පාදන හැකියාව

44. කිසියම් ආර්ථිකයක් 8%ක වාර්ෂික වර්ධන වේගයක් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර, එම රටෙහි ප්‍රාග්ධන නිමැවුම් අනුපාතය 5ක් වේ නම්, එම රට පවත්වා ගත යුතු ආයෝජන අනුපාතිකය වනුයේ
(1) 20% කි. (2) 30% කි. (3) 35% කි. (4) 40% කි. (5) 50% කි.

[10වන පිටුව බලන්න.

**45.** ශ්‍රී ලංකාවේ ජනගහන උපනතීන් පිළිබඳව විමර්ශනය කරන විට ස්වභාවික වර්ධන අනුපාතිකය හා ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය වෙනස් වූ ආකාරය පිළිබඳ වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

| | **ස්වභාවික වර්ධන අනුපාතිකය** | **ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය** |
|---|---|---|
| (1) | පහළ ගොස් ඇත. | පහළ ගොස් ඇත. |
| (2) | පහළ ගොස් ඇත. | ඉහළ ගොස් ඇත. |
| (3) | ඉහළ ගොස් ඇත. | ඉහළ ගොස් ඇත. |
| (4) | ඉහළ ගොස් ඇත. | පහළ ගොස් ඇත. |
| (5) | පහළ ගොස් ඇත. | ශුන්‍ය වී ඇත. |

**46.** මානව සංවර්ධනය මිනුම් කිරීමේ දී යහපත් ජීවන තත්ත්වයක් සඳහා අවශ්‍ය සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) තේරීමේ නිදහස, ආරක්ෂාව සහ යහපත් සමාජ සම්බන්ධතා.
(2) යහපත් සෞඛ්‍ය තත්වය, යහපත් ජීවිතයකට අවශ්‍ය දෑ සහ යහපාලනය.
(3) තේරීමේ නිදහස, යහපාලනය හා ආරක්ෂාව.
(4) යහපත් සමාජ සම්බන්ධතා, ආරක්ෂාව හා පාරිසරික සුරක්ෂිත බව.
(5) පාරිසරික සුරක්ෂිත බව, යහපාලනය හා තේරීමේ නිදහස.

**47.** 2009/10 වාර්තා අනුව ශ්‍රී ලංකාවේ වැඩිම දරිද්‍රතාව සහිත දිස්ත්‍රික්කය කුමක්ද?

(1) වව්නියා (2) මඩකලපුව (3) බදුල්ල (4) මොනරාගල (5) මුලතිව්

**48.** ආර්ථික සංවර්ධනය මිනුම් කිරීමේ දර්ශක කීපයක් පහත දැක්වේ.

A - ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය
B - ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය
C - ළදරු මරණ අනුපාතිකය
D - උපතේ දී ආයු අපේක්ෂාව

ඉහත සඳහන් දෑ අතුරෙන් මානව සංවර්ධන දර්ශකය සකස් කිරීමට යොදා ගන්නා උප දර්ශකයන් වනුයේ,

(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය. (5) C හා D ය.

**49.** 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් ලබා දුන් ශීර්ෂය වූයේ,

(1) නිෂ්පාදන කර්මාන්ත (2) ඉදිකිරීම්
(3) තොග හා සිල්ලර වෙළෙඳාම (4) හෝටල් හා ආපන ශාලා
(5) බැංකු, රක්ෂණ හා දේපොළ වෙළෙඳාම

**50.** කිසියම් රටක් සඳහා නිර්මාණය කළ ලෝරන්ස් වක්‍රය සමාදායම් රේඛාව මත පිහිටියේ නම්, එම රටේ ගිනි සංගුණකය

(1) අපරිමිත වේ. (2) 1.5 වේ. (3) 1 වේ. (4) 0.5 වේ. (5) 0 වේ.

* * *

## අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**ආර්ථික විද්‍යාව II** | **පැය තුනයි**

**සැලකිය යුතුයි :**

★ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

### I කොටස

1. (i) ''ආර්ථික පද්ධති වර්ග කිරීමට යොදා ගැනෙන නිර්ණායක අනුව විකල්ප ආර්ථික පද්ධති හඳුනාගත හැකිය.'' නිර්ණායක සහ ආර්ථික පද්ධති නම් කරමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 06)
   (ii) විකල්ප ආර්ථික පද්ධතීන්හි දී, නිෂ්පාදිතය බෙදා හැරීමේ ගැටළුව විසදෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)
   (iii) නිෂ්පාදන කාර්යක්ෂමතාවයේ පසුවන ආර්ථිකයක කාර්මික භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදවුම් අවශ්‍යතාව පෙරට වඩා පහළ යන ලදී. මෙම සිදුවීම, නිෂ්පාදන හැකියා මායිමක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (iv) මිශ්‍ර ආර්ථික පද්ධතියක ප්‍රධාන ලක්ෂණ කවරේ ද? (ලකුණු 03)
   (v) “සැලසුම් ආර්ථික පද්ධති අනුගමනය කළ බොහෝ රටවල් එම ක්‍රමය අතහැර වෙළෙඳ පොළ ක්‍රමයට මාරු වීමෙන් පෙනී යන්නේ මූලික ආර්ථික ප්‍රශ්න විසදීමේ ක්‍රමයක් වශයෙන් සැලසුම් ක්‍රමය යොදාගත නොහැකි බවය.” මෙම ප්‍රකාශයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක කවරේ ද? (ලකුණු 04)

2. (i) ඉල්ලුම් නීතිය යනු කුමක් ද? (ලකුණු 02)
   (ii) සළකා බලන භාණ්ඩයේ මිලත්, ඉල්ලුම් ප්‍රමාණයත් අතර අනුලෝම සම්බන්ධතාවක් හටගන්නා අවස්ථා මොනවා ද? (ලකුණු 02)
   (iii) පහත සඳහන් ප්‍රකාශ මගින් දැක්වෙන භාණ්ඩ ප්‍රභේද නම් කරන්න.
   (අ) ආදායම් ඉල්ලුම් නම්‍යතාව 1ට අඩු අගයක් ගන්නා භාණ්ඩ
   (ආ) ආදායම් ඉල්ලුම් නම්‍යතාව 1ට වැඩි අගයක් ගන්නා භාණ්ඩ
   (ඇ) හරස් ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගන්නා භාණ්ඩ
   (ඉ) හරස් ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගන්නා භාණ්ඩ (ලකුණු 04)
   (iv) කිසියම් භාණ්ඩයක වෙළෙඳ පොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.
   $Q_d = 600 - 10P$
   $Q_S = 10P$
   මෙම භාණ්ඩය සඳහා රජය විසින් රු.50ක සහතික මිලක් සමග අතිරික්තය මිල දී ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ යයි සිතන්න. ඒ අනුව පහත අසා ඇති දෑ ගණනය කරන්න.
   (i) සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය (ලකුණු 02)
   (ii) රජය විසින් අතිරික්තය මිලදී ගනු ලැබුවහොත් පාරිභෝගික පැහැදම හා ව්‍යාපාරික අයභාරය (ලකුණු 02)
   (iii) පාරිභෝගික අතිරික්තයේ වෙනස්වීම (ලකුණු 02)
   (iv) නිෂ්පාදක අතිරික්තයේ වෙනස්වීම (ලකුණු 02)
   (v) අතිරික්තය මිලදී ගැනීමේදී ආණ්ඩුවට දැරීමට සිදුවන පිරිවැය (ලකුණු 02)
   (vi) රජය විසින් සහතික මිල නියම කිරීම නිසා අහිමි වී යන සමාජ ශුභසාධනයේ වටිනාකම (ලකුණු 02)

3. (i) කෙටිකාලීන හා දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලින්හි යෙදවුම් සමග නිමැවුම් හැසිරීමට පදනම් වන නියමයන් කවරේ ද? (ලකුණු 04)
   (ii) කෙටිකාලීන සාමාන්‍ය විචල්‍ය පිරිවැය සහ දිගුකාලීන සාමාන්‍ය පිරිවැය හැසිරීම හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (iii) පූර්ණ තරග වෙළෙඳපොළක හා ඒකාධිකාරී වෙළෙඳපොළක කටයුතු කරන ආයතන මුහුණ දෙන ඉල්ලුම් වක්‍රවල ස්වරූපය පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (iv) පූර්ණ තරග වෙළෙඳපොළක කෙටිකාලය තුළ කටයුතු කරන ආයතනයක්, වසා දැමීමේ තීරණයට එළඹෙන්නේ කුමන අවස්ථාවේ ද? සුදුසු රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (v) ඒකාධිකාරී තරග වෙළෙඳපොළක සහ ඒකාධිකාරී වෙළෙඳපොළක වෙනස්කම් පෙන්වා දෙන්න. (ලකුණු 04)

[2වන පිටුව බලන්න.

4. (i) රජය විසින් සපයනු ලබන ශුභ සාධන සේවාවල අගය ජාතික ගිණුම්වලට ඇතුළත් කරනු ලබන්නේ කෙසේද? (ලකුණු 03)

(ii) 2013 වසරේ කල්පිත ආර්ථිකයක දත්ත පහත පරිදි වේ. සියලුම සංඛ්‍යා රු. බිලියන වලිනි.

| | |
|---|---|
| දළ දේශීය වියදම | 1800 |
| දළ දේශීය නිෂ්පාදිතය | 1200 |
| විදේශ ශුද්ධ සාධක ආදායම | -800 |
| විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම | 900 |
| ප්‍රාග්ධන ක්ෂයවීම් | 50 |
| ශුද්ධ වක්‍ර බදු | 120 |
| පරිභෝජන වියදම් | 600 |
| ගම්‍ය මිල දර්ශකය (2002 = 100) | 120 |
| 2012 වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය | 900 |

පහත අසා ඇති දෑ ගණනය කරන්න.

1. ශුද්ධ අපනයන (ලකුණු 01)
2. වැයකළ හැකි ජාතික ආදායම (ලකුණු 01)
3. දළ දේශීය ඉතුරුම් (ලකුණු 02)
4. ජාතික ඉතුරුම් (ලකුණු 01)
5. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ ශේෂය (ලකුණු 01)
6. ආර්ථික වර්ධන අනුපාතිකය (ලකුණු 02)

(iii) ද්වි ගණන දෝෂ වළක්වා ගනිමින්, වියදම් ප්‍රවේශය යටතේ ජාතික ගිණුම් සකස් කරන විට බැහැර කරනු ලබන වියදම් කවරේ ද? (ලකුණු 03)

(iv) "දළ දේශීය නිෂ්පාදිතය, ආදායම් ප්‍රවේශය යටතේ ගණනය කළද, එකතුකළ වටිනාකම් ප්‍රවේශය යටතේ ගණනය කළද ලැබෙනුයේ එකම අගයකි." ඔබ එකඟවන්නේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 03)

(v) මූර්ත ජාතික නිෂ්පාදිතය හා මූර්ත ජාතික ආදායම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 03)

5. (i) ආන්තික ඉතුරුම් නැඹියාව හා ආන්තික පරිභෝජන නැඹියාව යන සංකල්ප විග්‍රහ කොට සරල ආර්ථිකයක එම අගයන්හි එකතුව එකට සමාන වන බව පෙන්වන්න. (ලකුණු 04)

(ii) ජාතික ආදායමේ සමතුලිත මට්ටම යන්නෙන් කුමක් අදහස් වේද ? ඒ සඳහා සංවෘත ආර්ථිකයක කවර කොන්දේසි සපුරාලිය යුතු ද? (ලකුණු 04)

(iii) ආදායම් හා වියදම් ප්‍රවේශය යොදා ගනිමින් සරල ආර්ථිකයක සමතුලිත ආදායම තීරණය වන ආකාරය රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) සංවෘත ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය $S = -180 + 0{\cdot}2Yd$ වන අතර මෙම ආර්ථිකයේ ආයෝජන 120ක් හා රජයේ මිලදී ගැනීම් 160ක් ද ස්වාධීන බදු 100ක් ද වේ.

(අ) සමතුලිත නිමැවුම් මට්ටම, (ලකුණු 02)

(ආ) බදු ගුණකය හා රාජ්‍ය වියදම් ගුණකය ගණනය කර දක්වන්න. (ලකුණු 02)

(v) උද්ධමන පරතරය (*Inflationary Gap*) සහ සේවා වියුක්ති පරතරය (*Unemployment Gap*) යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

## II කොටස

6. (i) මුදලේ කාර්යයන් දක්වන්න. (ලකුණු 04)

(ii) 10%ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකයක් යටතේ කටයුතු කරන එක් වාණිජ බැංකුවක මුළු තැන්පතු රු.මිලියන 1800කි. සංචිත රු.මි. 200ක් ද සපයන ලද ණය රු.මි. 1600ක් ද වේ.

(අ) බැංකුවේ අධි සංචිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

(ආ) අළුතින් ණය සැපයූ පසු බැංකුවේ ශේෂ පත්‍රය සකස් කරන්න. (ලකුණු 02)

(ඇ) ණය ලබාගත් තැනැත්තන් විසින් ලියන ලද චෙක්පත් නිශ්කාශනය වීමෙන් පසු බැංකුවේ ශේෂ පත්‍රය සකස් කරන්න. (ලකුණු 02)

(iii) (අ) මුදල් පදනමේ සංරචක කවරේද ? (ලකුණු 02)

(ආ) රටක මුදල් ගුණකය 1 හෝ 1 ට වැඩි අගයක් ගනු ලබන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iv) මහ බැංකුව විසින් ප්‍රසාරණාත්මක ලෙස මුල්‍ය ප්‍රතිපත්ති උපකරණ හසුරුවන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 03)

(v) පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයට හේතු වන ප්‍රධාන සාධක දක්වන්න. (ලකුණු 03)

[3වන පිටුව බලන්න.

7. (i) යටිතල පහසුකම් සැපයීමෙහි ලා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ හවුල්කාරීත්ව ක්‍රමය (Public Private Partnership) යනු කුමක් ද? එහි වාසි කවරේද ? (ලකුණු 04)
(ii) ''බදු අයකිරීමේ මූලිකම අරමුණ වන්නේ සම්පත් ඒකරාශී කිරීම වේ.'' බදු අයකිරීම තුළින් රජයක් අපේක්ෂා කරනු ලබන වෙනත් අරමුණු මොනවා ද? (ලකුණු 04)
(iii) ආර්ථික වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදමේ ප්‍රධාන සංරචක මොනවා ද? (ලකුණු 04)
(iv) කිසියම් වර්ෂයක් තුළ රාජ්‍ය අය වැයෙහි දත්ත කිහිපයක් පහත දැක්වේ. සියලුම සංඛ්‍යා රු. මිලියනවලිනි.

| | |
|---|---|
| රාජ්‍ය ආදායම | 15000 |
| පුනරාවර්තන වියදම | 18500 |
| රාජ්‍ය ණය සඳහා පොළී ගෙවීම් | 500 |
| ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් | 7500 |
| විදේශ ප්‍රදාන | 2000 |
| වර්තන සංක්‍රාම | 3000 |

ඉහත තොරතුරු යොදා ගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.
(අ) වර්තන ගිණුමේ ශේෂය
(ආ) සමස්ත ශේෂය
(ඇ) ප්‍රාථමික ගිණුමේ ශේෂය
(ඉ) රාජ්‍ය පරිභෝජන වියදම (ලකුණු 04)
(v) රාජ්‍ය ණය තිරසාරභාවය යනු කුමක් ද? එය ඇගයීම සඳහා යොදා ගන්නා දර්ශකයේ මෑත කාලීන වෙනස්වීම් දක්වන්න. (ලකුණු 04)

8. (i) (අ) ජාත්‍යන්තර වෙළඳාමෙහි නිරපේක්ෂ වාසිය හා සාපේක්ෂ වාසිය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 03)
(ආ) සාපේක්ෂ වාසි න්‍යාය පදනම් වන්නේ කවර උපකල්පන මතද ? (ලකුණු 02)
(ii) (අ) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා බාධක පැනවීමට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක මොනවාද ? (ලකුණු 02)
(ආ) තීරු බදු නොවන වෙළෙඳ බාධක කවරේ ද? (ලකුණු 02)
(iii) විදේශීය සෘජු ආයෝජන, කළඹ ආයෝජනවලට වඩා වැදගත් වන්නේ ඇයි ? (ලකුණු 04)
(iv) ගෙවුම් ශේෂ හිඟයක් දිගු කාලීනව පවතී නම්, එය සමනය කිරීමට කරන යෝජනා කවරේද? (ලකුණු 03)
(v) ශ්‍රී ලංකාවේ විදේශ මූල්‍යායනයේ, විදේශ ණය පිළිබඳව මෑත කාලයේ හටගෙන ඇති වෙනස්කම් කවරේද ? (ලකුණු 04)

9. (i) (අ) ආර්ථික වෘද්ධියේ පිරිවැය කවරේද ? (ලකුණු 03)
(ආ) ආර්ථික සංවර්ධනය යන්නෙන් කුමක් අදහස් වේ ද ? (ලකුණු 04)
(ii) "මානව දරිද්‍රතාවයේ ප්‍රතිවිරුද්ධ අන්තය මානව සංවර්ධනය වේ". මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න. (ලකුණු 04)
(iii) (අ) මානව සංවර්ධන දර්ශකයේ ප්‍රධාන පැතිකඩ **තුන** කවරේ ද? (ලකුණු 03)
(ආ) බහුමාන දරිද්‍රතා දර්ශකය සකස් කිරීමේ දී යොදා ගැනෙන ප්‍රධාන විහීනතා කාණ්ඩ කවරේ ද? (ලකුණු 03)
(iv) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථික විෂමතා අවම කිරීම සඳහා පසුගිය දශකය තුළ රජය ගනු ලැබූ ප්‍රයත්නයන් කවරේ ද? (ලකුණු 03)

10. (i) ශ්‍රී ලංකාවේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය මැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කරන දර්ශකය නම් කොට එහි 2011-2012 වර්ෂවල උපනතීන් පරීක්ෂා කරන්න. (ලකුණු 03)
(ii) 'මහින්ද චින්තන ඉදිරි දැක්ම' ආර්ථික ප්‍රතිපත්තිය 2020 දක්වා දිගු කරමින් ඉදිරිපත් වූ 'නොනවතින ශ්‍රී ලංකාව' (Unstoppable Sri Lanka 2020) වාර්තාවේ සඳහන් පරිදි 2020 වන විට ළඟා කර ගැනීමට අපේක්ෂිත ආර්ථික ඉලක්ක කවරේ ද? (ලකුණු 03)
(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමෙහිලා ඉදිරිපත් කළ හැකි යෝජනා කවරේද? (ලකුණු 04)
(iv) සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයක් ලෙස දරිද්‍රතාව මුලිනුපුටා දැමීම සඳහා වූ ඉලක්කය ශ්‍රී ලංකාව විසින් කොතෙක් දුරට සාධනය කරගෙන තිබේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)
(v) 'දිවි නැගුම' වැඩ සටහනේ අරමුණු හා එහි වර්තමාන ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06)

* * *